# සොරගුණේ අලි - ඇතුන් ගේ නිජබිම ගොල්ෆ් පිටියකට යට කෙරේ

**සජීව චාමිකර**
**පරිසර සංරක්ෂණ භාරය**

අලි - මිනිස් සහජීවනය බිඳ හෙළමින්, වේලිඔය ව්‍යාපාරය යටතේ යල - මහ දෙකන්නය වගා කළ ජනතාව අවතැන් කරමින් සොරගුණේ දේවාලයේ නින්දගම් ඉඩම්වලට අයත් කොස්ගහමංකඩ වනාන්තරයේ අක්කර 628 ක් එළි පෙහෙළි කර "Eco Golf Resort" නමින් ගොල්ෆ් ක්‍රීඩා පිටියක් හා හෝටලයක් ඉදිකිරීමට වනාන්තර මැනීම හා ව්‍යාපෘතිය සැළැසුම් කිරීම මේ වන විට සිදු කෙරෙමින් පවතී. පසුගිය දිනවල ව්‍යාපෘති භූමියට පිවිසුම් මාර්ග සැකැසීමේ කටයුතු ද ක්‍රියාත්මක විය. හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රන්වන්ගුහාව ග්‍රාම නිලධාරී වසමේ දඩයම්පහළගම ග්‍රාමයේ පිහිටි වනාන්තර කොටසේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. කොළඹ 07, ධර්මපාල මාවතේ අංක 65/බී දරන ස්ථානයේ පිහිටි "Alpha and Omega Developers (Pvt) Ltd" නම් සමාගම විසින් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

මේ සඳහා යොදා ගන්නා ඉඩම් සොරගුණේ කුඩා කතරගම දේවාලයට අයත් නින්දගම් ඉඩම් වන අතර බෝගහපට්ටිය - සමනළ වැව අභයභූමිය ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජිත වනාන්තර ඉඩම් ය. මේ වනාන්තර ඉඩම වේලි ඔය වාරි ව්‍යාපෘතියේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ වන අතර උඩවලව ජාතික වනෝද්‍යානයට උතුරින් පිහිටි අලි - ඇතුන් ගේ සුවිශේෂී වාසස්ථානයකි.

මේ වනාන්තර බිම් සොරගුණේ කුඩා කතරගම දේවාලයේ බස්නායක නිලමේ එච්. එම්. ජනක රවීන්ද්‍ර කළුපහන මහතා විසින් වරින්වර වංචනික ලෙස විවිධ පුද්ගලයින්ට පැවරීම සිදු කරයි. අංක 1567 (2006.07.21 දින ලියාපදිංචි අංක J152/126 බදුල්ල) දරන ඔප්පුවේ උප ලේඛන ගත වනාන්තර ඉඩම් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගමේ ආයෝජකයා වන ඇමෙරිකාවේ පදිංචි වාසු රාසයියා නැමැත්තා ලබාගෙන ඇත්තේ ද එලෙස පැවරූ පුද්ගලයකුගෙනි. මේ ව්‍යාපෘතිය පිටුපස සිටින ප්‍රධාන දේශපාලන හස්තය වි. ජ. මු. ලොකු බණ්ඩාර මහතා ගේ පුත් හපුතලේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී උදිත් ලොකු බණ්ඩාර මහතා ය. මීට අමතර ව බණ්ඩාරවෙල ප්‍රධාන ව්‍යාපාරිකයකු ගේ පුත්‍රයකු හා හල්දුම්මුල්ල ප්‍රදේශයේ ඉහළ පෙළේ රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙකු මේ වනාන්තර ඉඩම් කොල්ලය හා ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ ව සිටී. මේ දේශපාලන හා නිලධාරී සම්බන්ධය හේතුවෙන් පාරිසරික අනපනත් තුට්ටුවකට මායිම් නොකර මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නා බවක් පෙනෙන්නට තිබේ.

සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව ප්‍රකාශිත 1993 ජුනි 24 දින අංක 772/22 දරන ගැසට් නිවේදනයට අනුව හෙක්ටයාර එකකට වඩා වැඩි වනාන්තර ඉඩමක් එළි පෙහෙළි කර වනාන්තර ආශ්‍රිත නොවන සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට යටත් ව පූර්ව ලිඛිත පාරිසරික අනුමැතිය ලබාගත යුතු ය. නමුත් ඊට ප්‍රථමයෙන් යෝජිත ව්‍යාපෘති භූමියේ වනාන්තරය පුරා වනාන්තර තීරු එළි පෙහෙළි කරමින් මැනීම් කටයුතු සිදු කිරීම හා මාර්ග සැකැසීම නීති විරෝධී ක්‍රියාවකි. මෙලෙස මහ පරිමාණ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථමයෙන් ඒ සඳහා අනුමැතිය ලැබේය යන පූර්ව නිගමනය මත සිට ව්‍යාපෘති භූමිය සකස් කිරීම ව්‍යාපෘති යෝජකයින්ගේ විලාසිතාවක් බවට ලංකාව තුළ පත් වෙමින් තිබේ. ඒ තත්ත්වය මැඩ

පැවැත්වීමට මධ්‍යම පරිසර අධිකාරිය සෘජුව මැදිහත් විය යුතු ය. ඒසේ නොවුනහොත් පුනර්ජනනය කළ නොහැකි මෙවන් සම්පත් ඊනියා සංවර්ධකයින් ගේ ගොදුරු බවට පත් වී වැනසී යනු ඇත.

මේ වන බිමට ද අත්වෙමින් තිබෙන්නේ එවන් ඉරණමකි. උඩවලව ජාතික වනෝද්‍යානය හා ඒ ආශ්‍රිත වනාන්තර පද්ධතිය අලි - ඇතුන් ගේ නිජබිමක් ලෙස අලි - මිනිස් සහජීවනයෙන් යුතු කලාපයක් ලෙස සංරක්ෂණය කිරීමේ හැකියාව පවතින මුත් දේශපාලන බලපෑම් මත අලි - මිනිස් සහජීවනය බිඳ හෙලීමේ ක්‍රියාකාරකම් මේ අයුරින් නීති විරෝධී ලෙස ක්‍රියාත්මක කිරීම කණගාටුවට කරුණකි.

උඩවලව ජාතික වනෝද්‍යානයේ සිට උතුරු දෙසට අලි - ඇතුන් ගේ සංක්‍රමණික ගමන් මාර්ගය විහිදී ඇත්තේ දහයියාගල අභය භූමිය හරහා බෝගහපිටිය, සමනළ වැව වනාන්තරය, සොරගුණේ කැලය හා රජවක වනාන්තර ප්‍රදේශ දක්වායි. මේ ප්‍රදේශය බෝගහපට්ටිය - සමනළ වැව අභයභූමිය ලෙසට ප්‍රකාශයට පත් කිරීමට වසර ගණනාවක සිට යෝජනා ඉදිරිපත් වී ඇත. එසේ වුවත් අද වන විට ද බෝගහපට්ටිය - සමනළ වැව අභයභූමිය යෝජිත තත්ත්වයේ පවතින අතර, සොරගුණේ කැලය, වන පාළුවන්ගේ රජදහනක් ව පවතී. මේ තත්ත්වය අලි - මිනිස් සහජීවනය බිඳ හෙලීමට ප්‍රබල ලෙස බලපා තිබේ. එසේ පවතිද්දී අලි සමීක්ෂණ සිදු කර අලි - ඇතුන් සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගන්නා බවට නිලධාරීන් වහසි බස් දොඩවයි. නමුත් මේ වනාන්තරය රක්ෂිත තත්ත්වයට පත් කර අලි - ඇතුන් ඇතුළු වනජීවීන් ගේ රැකවරණය තහවුරු කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මේ වන විටත් නො හැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වනාන්තරය ගොල්ෆ් පිටියකට මෙලෙස බිලි වීම පුදුමයට කරුනක් නොවේ.

උඩවලව ජාතික වනෝද්‍යානයේ සිටින අලි - ඇත්තු දහයියාගල අභය භූමිය හරහා බෝගහපට්ටිය, සොරගුනේ හා සමනළ වැව වනාන්තර ප්‍රදේශවලට සංක්‍රමණය වන්නේ එහි පිහිටි කරමැටිය නම් සුවිශේෂී ලවණ නිධියෙන් ලවණ අවශ්‍යතාවය සපුරා ගැනීමට ය. මේ ප්‍රදේශයට අලින්ට අමතර ව ප්‍රමාණයෙන් විශාල ක්ෂීරපායී සතුන් බොහොමයක් ලවණ ලබා ගැනීමට එක්රැස් වීම සිදු වේ.

සොරගුණේ වනාන්තරය යනු බෝගහපට්ටිය වනාන්තරය හා සම්බන්ධ ව පිහිටි අක්කර 12000 ක් පමණ වන සොරගුණේ දේවාලයට අයත් නින්දගම් ඉඩමකි. යෝජිත බෝගහපට්ටිය අභය භූමියට මේ නින්දගම් ඉඩම ඇතුළත් වේ. තව ද මේ වනාන්තරය කාල්කන්නි වනාන්තරය ලෙස ද හැඳින්වේ. වේලි ඔයේ සහ කාල්කන්නි ඔයේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ වන්නේ සොරගුණේ වනාන්තරය යි. වේලි ඔය හරස් කර ලබා ගන්නා ජලයෙන් ක්‍රියාත්මක වන වේලි ඔය වාරි ව්‍යාපාරයේ පැවැත්ම රඳාපවතින්නේ ද සොරගුණේ වනාන්තර ප්‍රදේශයේ සුරක්ෂිතතාව මත ය. වේලි ඔය ව්‍යාපාරයෙන් දහයියාගල, මහ නෙටුල, කුඩා නෙටුල, බෝගස් වැව, හම්බෙගමුව, පොකුණුතැන්න, දිවුලාන ප්‍රදේශවල පිහිටි වැව් 27 කට පමණ ජලය ලබා දේ. ඒ යටතේ යල - මහ දෙකන්නය වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය 3000 ක් පමණ වේ.

යෝජිත ගොල්ෆ් ව්‍යාපෘතියත් සමඟ ම මේ සියල්ල වැනසී යයි. ඊට හේතුව ගොල්ෆ් ක්‍රීඩා පිටිය හා හෝටලය ඉදි කිරීම සඳහා ඉවත් කරන වනාන්තර ප්‍රදේශය වේලි ඔයේ ප්‍රධාන ජලධාරා ප්‍රදේශය වන නිසා ය. මේ වනය එළි කිරීමත් සමඟ ම වේලි ඔය ව්‍යාපාරය උග්‍ර ජල හිඟයකට මුහුණ දෙනු ඇත. එය තවත් දෙගුණ තෙගුණ වන්නේ ගොල්ෆ් ක්‍රීඩා පිටිය නඩත්තු කිරීම සඳහා යෙදීමට සිදු වන අති විශාල ජල ප්‍රමාණය නිසා ය. ඒ සඳහා අවශ්‍ය ජලය වේලි ඔයෙන් හෝ භූගත ජලයෙන් ලබා ගැනීමට සිදු වනු ඇත. එසේ නොමැති ව ඊට වෙනත් විකල්ප නොමැත. එසේ ජලය ලබා ගත හොත් සිදු වන්නේ වේලි ඔය ව්‍යාපාරය යටතේ වගා කරන සියලු ගොවීන් ජලය නොමැති ව අවතැන් වීම යි.

වියළි කලාපයේ ගොල්ෆ් ක්‍රීඩා පිටියක් ඉදිකර එහි තණ පිටිය කොළ පැහැයෙන් පවත්වා ගැනීමට විශාල ජල ප්‍රමාණයක් යෙදිය යුතු අතර ම, යූරියා පොහොර ද විශාල වශයෙන් යෙදිය යුතු වේ. එසේ පවත්වා ගෙන යන තණ පිටියකට කෘමි උවදුරු ප්‍රමාණය වැඩිවන අතර, ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා අධික ලෙස කෘමිනාශක යෙදිය යුතු ය. එපමණක් නො ව පාංශු බාදනය වැළැක්වීම සඳහා පස් අංශු බැඳ තැබීමට ඇළුමිනියම් අඩංගු සංයෝග තණ පිටියට යෙදිය යුතු වේ. මේ ආකාරයෙන් ගොල්ෆ් පිටියට අධික ව යොදන රසායනික ද්‍රව්‍ය අවසානයේ සාන්ද්‍රගත වන්නේ වේලි ඔය ව්‍යාපාරයෙන් ජලය සපයන වැව්වල ය. මෙලෙස දූෂණය වන ජලය දෛනික කටයුතු සඳහා භාවිතයට ගැනීමට වේලිඔයේ ජල පාරිභෝගිකයින්ට සිදුවනු ඇත. ඒ අනුව මේ ප්‍රදේශයේ සෞඛ්‍ය ප්‍රශ්න රැසක් මතු කිරීමට මේ ව්‍යාපෘතිය හේතු වේ. එපමණක් නො ව වියළි කලාපයේ උග්‍ර පානීය ජල හිඟයක් හා ඒ ඔස්සේ සමාජීය ගැටුලු රැසක් ඇති කිරීමට ද මේ ව්‍යාපෘතිය හේතු වනු ඇත.

සොරගුණේ වනාන්තරය රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජවක යෝජිත රක්ෂිතය, බදුල්ල දිස්ත්‍රික්කයට අයත් වෙලන්විට යෝජිත රක්ෂිතය හා කොස්ගම යෝජිත රක්ෂිතය හා සම්බන්ධ ව පවතී. මීට අමතර ව මේ වනාන්තරය වලවේ ගඟ දක්වා ම ව්‍යාප්තව ඇත. එබැවින් මෙය වලවේ ගඟේ ජල පෝෂක ප්‍රදේශයක් ලෙස ද ක්‍රියාත්මක වේ.

එසේ ම මේ වන්නාන්තර ප්‍රදේශය වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, ගංගාශ්‍රිත වනාන්තර සහ සැවානා තණ බිම්වලින් සමන්විත ය. මෙහි ශාක විවිධත්වය පිළිබඳ ව මෙතෙක් ප්‍රමාණවත් අධ්‍යයනයක් සිදු කර නොමැති මුත් ඌව ප්‍රදේශයට ආවේණික ඌව මැන්දෝරා ශාකය ඇතුළු ව කොන්, මී, කුඹුක්, මිල්ල, බුරුත, වෙලං, මාදං, අරළු, බුළු, නෙල්ලි වැනි ශාක දැක ගත හැකි බව නිරීක්ෂණ වල දී අනාවරණය වී තිබේ.

බෝගහපට්ටිය - සොරගුණේ - සමනල වැව වනාන්තර ප්‍රදේශයේ සමස්ත පෘෂ්ඨවංශී සත්ත්ව විවිධත්වය පිළිබඳ ව පුළුල් අධ්‍යයනයක් මේ වන විට සිදු කර තිබේ. Herpetological Foundation of Sri Lanka ආයතනයේ එල්. ජේ. මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා විසින් මේ අධ්‍යයනය සිදු කර ඇති අතර, එහි වාර්තාව "A Vertebrate Faunal Survey of Samanala wewa, Towards Declaration as a Wildlife National Park" නමින් සකස් කර තිබේ. මේ වාර්තාව අනුව බෝගහපට්ටිය - සොරගුණේ - සමනල වැව වනාන්තර පද්ධතියේ පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩ 5 ට අයත් විශේෂ 390 ක් පමණ වාර්තා වී තිබේ. ඉන් විශේෂ 59 ක් ලංකාවට ආවේණික වෙති. ලංකාවේ වාර්තාවන පෘෂ්ඨවංශී සත්ත්ව විශේෂ අතුරින් 40% ක් සහ ලංකාවට ආවේණික පෘෂ්ඨවංශීන් අතුරින් 19% ක් මේ වනාන්තර පද්ධතියෙන් වාර්තා වී ඇති අතර, එය මේ වනාන්තරයේ වටිනාකම ඉතා හොඳින් අවබෝධ කර දීමට වැදගත් වේ.

**බෝගහපට්ටිය - සොරගුණේ - සමනල වැව වනාන්තර ප්‍රදේශයේ වාර්තාවන පෘෂ්ඨවංශී සත්ත්ව විවිධත්වය**

| සත්ත්ව කාණ්ඩය | විශේෂ ගණන | ආවේණික විශේෂ ගණන |
|---|---|---|
| මත්ස්‍යයින් | 39 | 8 |
| උභයජීවීන් | 23 | 11 |
| උරගයන් | 76 | 29 |
| පක්ෂීන් | 208 | 09 |
| ක්ෂීරපායින් | 44 | 03 |
| **එකතුව** | **390** | **59** |

මේ අධ්‍යයනයට අනුව ඉතා දුර්ලභ සත්ත්ව විශේෂ කිහිපයක් මේ වනාන්තර පද්ධතියෙන් අලුතින් වාර්තා කිරීමටත් විද්‍යා ලොවට නව සත්ත්ව විශේෂ කිහිපයක් සොයා ගැනීමටත් හැකි ව තිබේ. එපමණක් නො ව තෙත් කලාපීය වනාන්තරවල පමණක් වාර්තා වන සමහර සත්ත්ව විශේෂ වියළි කලාපයේ පිහිටි මේ වනාන්තර පද්ධතියෙන් වාර්තා කිරීමට හැකි වීම මේ වනාන්තර පද්ධතියේ සුවිශේෂත්වයට තවත් හේතුවක් වේ.

මෙහි දියපහරවල ලංකාවට ආවේණික බුලත් හපයා (*Puntius nigrofasciatus*) සහ තල් කොස්සා (*Belontia signata*) යන තෙත් කලාපීය මත්ස්‍ය විශේෂ වාර්තා වීම සුවිශේෂත්වයකි.

උභයජීවීන් අතුරින් *Pseudophilautus* ගනයට අයත් විශේෂ දෙකක් මේ ප්‍රදේශයෙන් අලුතින් වාර්තා කිරීමට හැකි ව තිබේ. එම විශේෂ දෙක මේ වන විට නාමකරණය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

ලංකාවේ ඉතාම දුර්ලභ සිව්පා උරගුන් විශේෂ දෙකක් මේ ප්‍රදේශයේ වාර්තා කිරීමට හැකි ව තිබේ. එනම් පඳුරු කටුස්සන් විශේෂයක් වන *Ophisops leschenaultii* හා හිකනලුන් විශේෂයක් වන *Dasia halianus* ය. මීට අමතර ව පොළොන් තෙලිස්සන් අයත් වන *Hypnale* ගනයට අයත් එක් විශේෂයක් හා පළා පොළොගුන් අයත් වන *Trimeresurus* ගනයට අයත් එක් විශේෂයක් මේ ප්‍රදේශයේ අලුතින් සොයා ගැනීමට හැකි ව තිබේ. එම විශේෂ තවම නාමකරණය කිරීම සිදු කර නොමැත. තවද පාංශුවාසී සර්පයන් වන කනඇල්ලන් අයත්වන *Typhlops* ගනයට අයත් විශේෂ දෙකක් ද මේ වනාන්තරයෙන් අලුතින් සොයා ගැනීමට එම අධ්‍යයනයේ දී හැකි ව තිබේ.

මේ වනාන්තර පද්ධතියෙන් ඉතා දුර්ලභ නේවාසික හා සංක්‍රමණික පක්ෂි විශේෂ ගණනාවක් වාර්තා කර තිබේ. ඒ අතුරින් වත රතු මල් කොහා (Red - faced Malkoha) ගංගාශ්‍රිත වනාන්තරවලින් වාර්තා කර ඇත. දුර්ලභ පක්ෂීන් වන හිස රන් කහකුරුල්ලා (Golden Oriole), තඹල බස්සා (Bay Owl), රත් කොණ්ඩ කොහා (Chestnut - winged Cuckoo), කොඩ කෑරලා (Rufous Woodpecker), බඩ රතු රාජාලියා (Roufous - bellied Hawk eagle), ගෙබිකට බස්සා (Frogmouth) යන විශේෂ මේ වනාන්තර ප්‍රදේශයේ වාර්තා වෙති.

ක්ෂීරපායින් අතුරින් මේ වනාන්තර පද්ධතියෙන් අලින් ගේ සැලකිය යුතු ගහනයක් වාර්තා වෙති. ලංකාවට ආවේණික දුර්ලභ ක්ෂීරපායී විශේෂයක් වන රන් හෝතඹුවා (Golden Palm civet) ඇතුළු ව විශේෂ රැසක් මෙහි වාර්තා වීම විශේෂත්වයකි. මෙවන් සුවිශේෂී ජෛව විවිධත්වයක් දරා සිටින ලංකාවෙන් අලුතින් සොයාගත් ඉතා ම දුර්ලභ හා මුළු ලොවින් ම මේ ප්‍රදේශයට පමණක් සීමා වී ඇති වී විශේෂ හයකට වාසස්ථාන සපයන සුවිශේෂී අනාරක්ෂිත වනාන්තර ප්‍රදේශයක් වන බෝගහපට්ටිය - සොරගුණේ - සමනල වැව වනාන්තර ප්‍රදේශය ගොල්ෆ් ක්‍රීඩා පිටියකට යට කිරීම නො ව ඉතා ම කඩිනමින් ආරක්ෂා කළ යුතු ව ඇත.

මෙකී සමස්ත ප්‍රදේශයේ අලි - මිනිස් සහජීවනය ඇති කිරීම සඳහා ආරක්ෂිත වනාන්තර පද්ධතියක් ගොඩනැගීම හා ඒ සඳහා නිවැරැදි ඒකාබද්ධ සැලැසුමක් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක් ව සකස් කළ යුතු ය. එමඟින් සමනළ වැව ජලාශයේ සිට බඳුලුදෙන, වේලිඹය, කල්තොට, සොරගුණේ, මහලන්ද, සිරිපුර වැව දක්වා සමස්ත ප්‍රදේශය දහයියාගල අභය භූමියට සම්බන්ධ කළ හැකි ය. එතැන් සිට උඩවලව ජාතික වනෝද්‍යානයටත්, වැටහිරකන්ද ස්වභාව රක්ෂිතය හරහා ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයටත් එහි සිට යාල වන සංකීර්ණය දක්වාත් අලි - ඇතුන් ගේ වාසස්ථාන සහ සාම්ප්‍රදායික සංක්‍රමණික මාර්ග සංරක්ෂණය කළ හැකි අතර, වනාන්තර පද්ධතියක් ලෙස මේ ආරක්ෂිත ප්‍රදේශ ජාලය වනජීවීන් වෙනුවෙන් සුරක්ෂිත කළ හැකි වනු ඇත.

එපමණක් නො ව මේ වනාන්තර පද්ධතියේ පැවැත්ම හා රක්ෂිත වනාන්තර ජාලයේ පැවැත්ම දෙකඩ කර අලි ඇතුන් ගේ සංක්‍රමණික මාර්ග අහුරමින් ඊනියා සංවර්ධන හා පරිසර හිතකාමී සංචාරක ව්‍යාපෘති වේෂයෙන් ස්වාභාවික සම්පත් ගිල ගැනීමට හා ගොවි ජනතාව අවතැන් කිරීමට "ඉකෝ" ලේබලය යටතේ ක්‍රියාත්මක වන ගොල්ෆ් ක්‍රීඩා පිටිය ද සම්පූර්ණයෙන් ම නතර කිරීමට පියවර ගත යුතු ව ඇත. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මෙන්ම පරිසර අමාත්‍යංශය ද වහා ම පියවර ගත යුතු ව තිබේ. එපමණක් නො ව මේ අනාරක්ෂිත වනාන්තර ප්‍රදේශ කඩිනමින් ආරක්ෂිත වනජීවී කලාපයක් කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යංශය කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු ව ඇත. එතෙක් රටේ ස්වාභාවික සම්පත් රැකගැනීම සඳහා වෙහෙසෙන පරිසරවේදීන් වන අප අවදානයෙන් බලා සිටින්නෙමු.

**යෝජිත ව්‍යාපෘති බිමේ පිහිටි වේලි ඔයේ පෝෂක දියදහරාවන්**





ගොල්ෆ් පිටිය සඳහා කපා ඉවත් කිරීමට යෝජිත ශාක



ගොල්ෆ් පිටිය සඳහා කපා ඉවත් කිරීමට යෝජිත වනාන්තරය

